**රාජකීය විද්‍යාලය – කොළඹ 07**

**පළමු වාර පරීක්ෂණය - 2011**

**සිංහල භාෂාව හා සාහිත්‍යය - 08 ශ්‍රේණිය**

**කාලය පැය 1 1/2යි.**

**පන්තිය** …………………….. **අංකය** ……………………

---

* නිවැරදි පිළිතුරට හිමි අංකය ඉදිරියෙන් ඇති කොටුවෙහි සටහන් කරන්න.

1) සිංහල වර්ණ මාලාවට අයත් ස්වර ගණන

i. විස්සකි. ii. දහඅටකි. iii. දසයකි. iv. තිහකි. ☐

2) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචන පෙළ

i. ශිෂ්‍යාචාරය, ප්‍රශ්ණ, ඖෂධ, ඓතිහාසික.

ii. වීරෝධාර, අවදානය, විශ්මය, කුශලතා.

iii. සංකේත, ධර්මිෂ්ඨ, මජ්ඣිම, සජ්ඣායනය.

iv. දක්ශිණ, භීෂන, පරිසනකය, යතාර්ථය

☐

3) විරුද්ධ අර්ථ සහිත යුගල පදය වන්නේ,

i. සණ්ඩආ දබර ii. ලට්ට ලොට්ට. iii. සිරිත් විරිත්. iv. සොයාබලා

☐

4) නිවැරදිව ලියා ඇති වැකිය නම්,

i. තරුණ තරුණියෝ උදෑසනම පැමිණ ශ්‍රමදානයට සහභාගි වුහ.

ii. ගායක - ගායිකාවන් වේදිකාව මතට පැමිණියහ.

iii. අසත් පුරුෂ මිතුරන් අපි අත් හැරිය හ.

iv. නංගී තෙල් මල් රැගෙන පන්සල් ගියේය.

☐

5) ජාති, ද්‍රව්‍ය, ගුණ, ක්‍රියා නාම වලට උදහරණ පිළිවෙලින්

i. මිනිසා, මේසය, පැහැපත්, නැටුම.

ii. නැටුම, මේසය, මිනිසා, පැහැපත්.

iii. පැහැපත්, මේසය, නැටුම, මිනිසා,

iv. මිනිසා, පැහැපත්, මේසය, නැටුම,

6) එතෙර "සුවඳ" කුරු කෘතිය ඇසුරින් සැකසුනු මෙතෙර පාඩමේ ප්‍රධාන චරිත තුන

i. අම්මා, පොඩිනා, පුංචිරාල.

ii. වසන්තා, අම්මා, පොඩිනා,

iii. පුංචිරාල, වසන්තා, අම්මා.

iv. රාජා, පොඩිනා, පුංචිරාල.

7) මෙම වැකි වලින් වැරදි පණිවිඩයක් දෙන වැකිය,

i. එකක් සිතා අනෙකක් කීම ඉතාම අප්‍රසාදජනකය.

ii. බොරුවක් හෙළ වු විට පළමු ප්‍රහාරය එල්ල වන්නේ,

iii. කෙනෙකුගේ යහපත් පැවැත්ම "භාෂාව" නිසි ලෙස විශ්වාස්‍යත්වයි.

iv. සන්නිවේදන කාර්යයේදී සදචාරවත් භාෂාවක් යොද ගැනිම අනිවාර්‍ය නොවේ.

8) සමානාර්ථ පද පමණක් ඇතුළත් පද පේළිය.

i. රාත්‍රිය, රැය, සන්ධ්‍යාව, ප්‍රභාතය.

ii. කුසලතා, හැකියා, ශක්‍යතා, අඛණ්ඩතා.

iii. භාෂාව, බස, ශබ්දය, උච්චාරණය.

iv. දිනකර, දිවයුරු, ඉර, සූර්යයා.

9) "මහතෙල්" සුවඳමය - කුඩමසු පිළී ගඳ මය" යන කිවියෙන් අදහස් කරන්නේ,

i. මල් වල අසිරිය පිළිබඳවය.

ii. මසුන් වල අසිරය පිළිබඳවය.

iii. යහපත් - අයහපත් සියළු දෙසට වචනය මුල් වන බවය.

iv. ජලය අපට ඉතා වැදගත් බව ය.

10) වේදිකා නාට්‍යයක "පුරක" යන නමින් හඳුන්වන්නේ

i. ප්‍රධාන නළුවා.

ii. පොතේ ගුරු.

iii. සංගීතය සපයන්නා.

iv. ශාලාව අලංකෘර කරන්නා

11) මුදු මොලොක් මල මෙහේ - කුසදරා බැති පෙමින් වේදනා විඳිමිනේ - අප ලොවට බිහි කෙරූ මෙසේ පවසන්නේ,

i. ජීවහත්ත. ii. දිසාල.

iii. පූරක. iv. දඬයක්කරු.

12) සඤ්ඤක අකුරු නිසි තැන යොද ලියැවී ඇති නිවැරදි වාක්‍යය වන්නේ,

i. පුන් පෝද හඳ දුටු මගේ හද සතුටින් පිරුණි.

ii. අබ වැංජනය පිසූ අම්මා එය වඩාත් රසවත් කිරීමට අඹ ටිකක් යෙදුවා ය.

iii. නුඹ ගැබ සිසාරා සියොත් කැළ ඉගිලෙන සැටි නුබ දුටුවෙහි ද ?

iv. රජු තම අඟ මෙහෙසිය සමඟ උයනට පිවිසියේ උල් වූ අග ඇති ගවයන් බැඳ රථයකිනි.

13) සඤ්ඤක අක්ෂර පිළිබඳන වැැර අදහසක් දෙන වැකිය.

i. සඤ්ඤක අකුරු අර්ධ අනුනාසිකාක්ෂර නමින් ද හැඳින් වේ.

ii. සිංහල හෝඩියේ සඤ්ඤක අක්ෂර නමින් ද හැඳින් වේ.

iii. මේවා සැදෙන්නේ ඞ, ඤ, ණ, න, ම යන නාසික්‍ය අක්ෂර ග,ජ, ඩ, ද, බ යන අකුරු සමඟ පිළිවෙලින් එක්වීමෙනි.

iv. මෙහි "ඩ" අක්ෂරය බින්දුව සඳහා ද යෙදෙයි.

14) නාට්‍ය රංගනයේ දී නොකළ යුතු කරුණු වන්නේ,

i. අවශ්‍ය තැන හඬ පාලනය.

ii. දෙබස් කථන විලාසයෙන් පැවසීම.

iii. උචිත තැන්වල අභිනය.

iv. දෙබස් හා ගීත කට පාඩම් නොකර හඬ පටයක් ඒ සඳහා භාවිත කිරීම.

15) මේවා අකුරෙන් වැරදි ප්‍රකාශය වන්නේ,

i. නාම පදයක ප්‍රකෘතියේ "ල" කාර දෙකක් ඇති විට බොහෝ විට මුල් ශබ්දය මූර්ධජ "ළ" වේ.

ii. ස්ථානවාචී "පොළ" යන්න මූර්ධජ "ළ" කාරය සහිතව යෙදේ.

iii. ළපටි, ළා යන අදහස ඇති වචනවල මූර්ධජ "ළ" මුලට යෙදේ.

iv. සමූහයක් හැඟවීමේදී එම පදවල අගට "ළ" නොයෙ දේ.

16) හිස්තැන් වලට සුදුසු අක්ෂර පිළිවෙලින්

i. ණ, න, ළ, ල.   ii. න, ණ, ල, ළ.

iii. ණ, ළ, ල, න   iv. ණ, ල, ළ, න

17) අලුත් අලුත් දෑ නොතනන ජාතිය ලොව නොහඟී හිඟා කෑම බැරි වුණු තැන ලඟී ගයා මර ගී මෙම ප්‍රකාශය කරනු ලැබුවේ.

i. මාර්ටින් වික්‍රමසිංහ මහතා.   ii. කුමාරතුංග මුනිදස මහතා.

iii. ධර්මරත්න ගමගේ මහතා.   iv. හෙන්රි ජයසේන මහතා.

18) සුමන සමන් දිව්‍යරාජයාගේ අඩවිය නමින් හඳුන්වන නගරය,

i. මහනුවර.   ii. දඹදෙණිය.

iii. රත්නපුරය.   iv. පොළොන්නරුව.

19) මැණික් කර්මාන්තයට අදළ නොවන පදය වන්නේ,

i. හණ පෝරුව.   ii. දිමි ඇස්.

iii. සක පෝරුව.   iv. ගඟ ඇදීම.

20) පහත සඳහන් යෙදුම් අතරින් "රූඩී" පදයක් නොවන්නේ,

i. ඉහේ මලක් පිපුණා.   ii. සායම ගියා.

iii. වක්කඩේ හකුරු හැංගුවා වගේ.   iv. කනෙන් රිංගුවා

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

ඔබ පාසලේ පැවැත් වූ "කුමාරතුංග මුනිදස" අනුස්මරණ දිනය" නිමිති කොට පවත්වන ලද උත්සවය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i. "කුමාරතුංග මුනිදාස අනුස්මරණ දිනය" යෙදී ඇත්තේ කවරදාට ද?

ii. ඔබ පාසලේ ප්‍රධාව අමුත්තා වශයෙන් පැමිනියේ කුමාරතුංග මුනිදස සුරින් ගේ මුණුබුරෙකි.කැමාරතුංග පරපුරෙන් පාවත එන ඔහු කව්ද?

iii. එදින පැවති උත්සවයේ දී ඔබගේ සිත් ගත් එක් අංගයක් පිළිබඳවත් එයට හේතුවක් දක්වමින් වැකි දෙකක් ලියන්න.

iv. හොඳ දේ සිතන ,සිතූ දේ කියන , කී දේ කරන උදාර දරුවාගේ නම කුමක්ද?

v. මාතර දික්වැල්ලේ වැවුරුකන්නල සිංහල සමිතිය මගින් කරන ලද උතුම් කාර්යය කුමක්ද?

vi. සිංහල භාෂාව නිවැරදිව ඉගෙනිම හා උච්චාරණය පිළිබදව පන්ති කාමරය තුළ ළමුන්ට අමතරව සතුන් යොදා ගනිමින්, කුමරගුවන් නිර්මාණය කළ කෘතිය ඇසුරින් එදින වේදිකා ගත වූ නාට්‍යයේ නම ලියන්න.

vii. කුමරතුගු මුනදස් පඩිතුමා රචනා කළ ළමා කෘති දෙකක් නම් කරන්න.

viii. කුමාරතුංග මුනිදස වියතාණන් රචනා කළමේ කවි පෙළ කියවාඅසා ඇති ප්‍රශ්න දෙකට පිළිතරු ලියන්න.

නුවණට වැඩි දෙයක් - කිසි තැනෙක නැති බව දැන
කරනු තැන් එය ලැබුමට - තමා බල ඇති පමණින්
නුවණැතියන් සිටින - සබාවට පැමිණි කල
නුවණ නැත්තෝ විළියෙන් - පසුබා සිටිත් කරබා
නුවණැත්තො එ ලෙස - නොසිටියත් කිසි සබාවෙක
රජුහටත් නො ලැබිය හැකි - ගුරු බුහුමන් ලබත් මැයි.
හොඳ නරක දැනුමෙත් - නො ලැබේ නුවණ නැත හොත්
එ හෙයින් හොඳ ය සලකා - කරන දෙය ද නොහොඳ වේ

i. මෙහි සඳහන් ආකාරයට තම ශක්ති ප්‍රමාණයෙන් උත්සය කළ යුත්තේ කුමක් ලබා ගැනීමටද?

ii. විළියෙන් පසුබා සිටින්නෝ කවරහුද?

iii. රජුනටත් නොලැබෙන බුහුමන් ලබන්නෝ කවරහුද?

iv. නුවණ ලබා නොගත් අයගේ ලක්ෂණය කුමක්ද?

2) ඔබ පියෙකි - සොහොහුරෙකි

මහ බලැති - එක හිතකි

අහසේ දෙව් රුවකි

**<u>මට මගේ රට ලබා දුන් ආදරණීය රණවිරුවාණෙනි</u>**

හිරුට හොරා පිබිදී ගොවිපලට ඇදෙනවා

සඳුට සිනා සී කුඹුරෙන් ගොඩ වී එනවා

පායන හිරු සඳුට ලැදිව දිවි සැරසෙනවා

මුහුදේ හිරු නාන කලට අඟ සෝදනවා

**<u>ගොවියා දැයට බත සපයන දෙවියා ය.</u>**

නීල කොබෙයි රූන ඇදී

වී අහුලන ඉපනැල්ලේ

මාල ගිරව් පේළි සැදිලා

නව අවුරුදු ගීත ගයනවා

**<u>අලුත් අවුරුද්ද ඇවිත්</u>**

දුටුවන් මන නුවන් බඳනා , නීල කරදීය වළල්ලෙන් වටවූ **<u>පෙරදිග ලෝකයේ බබළන මුතු ඇටය</u>** මා උපන් දේශයයි.

රත් නුවන් අහසට බමන්නිය - රත් මලින් සියොළත සදන්නිය

රත් දළින් නරයන් බුදන්නිය - නොදන්නෝ කවුරු කුවේණි රුදුරු

කවුරුන් කෙසේ කීවද , අපේ අම්මා අපට උතුම්ය සෙනෙවන්තය. **<u>අප මැණියන් එනතුරු බලා සිටින්නෙමු</u>**

ඉහත සඳහන් ගීත ඛණ්ඩ හා යෙදුම් ඇසුරු කර ගනිමින් වචන එකසිය පනහක පමණ රචනයක් ලියන්න. ඉරි ඇඳි වැකි මාතෘකාව ලෙස යොදන්න. ( අත් අකුරු, නිවැරදි අක්ෂර වින්‍යාසය හා උක්ත ආඛ්‍යාත පිළිබඳව සැලකිලිමත් වන්න.)

(ලකුණු 14)

**3)** මෙම ගීතයේ ඇති මහප්‍රාණ දහය අකුරෙන් අටක් සොයා යටින් ඉරක් අඳින්න.

දන මන නයන වශී කළ ලංකා ශාන්ත සුබදායි

ජන්ම භූමි ධරණී

මධුකර භෘංග සමූය විභූෂිත විකසිත පුෂ්ප කලාප සුගන්ධිත

මනෝහාර ගිරි ඇති ශිඛර අලංකෘත පූණ්‍ය භූමි ධරණී.

සුදුසු යුගල පද පහත සඳහන් වරහන් තුළ ඇති හිස්තැනෙහි ලියන්න.

1. ....................................... ඇති පවුලක එකම දරුවා වූ ප්‍රශාන් 2. ................................. කෑමට රුසියෙකි 3. ................................ වල 4. ................................ කියා දීමට වත් ඔවුන්ගේ දෙමාපියන්ට වේලාවක් නැත.ක්ෂණික ආහාර ගැනීම නිසා නිතර 5. .................................. වලට ද ඔහු ගොදුරු

වේ.දිනක් වෛද්‍යවරයකු හමුවීමට ගිය අවස්ථාවේ ප්‍රශාන්ගේ දෙමාපියන්ට ඔහු පැවසුවේ කොතරම් 6. ...................................... රැගෙන දුන්නද, එයට වඩා දරුවාගේ 7..................................... සොයා බැලීමත් 8. ................................ කියා දීමත් දෙමාපියන් විසින් අතපසු නොකළ යුතුය.
(හොඳ නරක, බඩු මුට්ටු ,මිල මුදල්, අනම් මනම්, ආහාර පාන, ලෙඩ රෝග, ගුණ අගුණ, දුක සැප)

අවශ්‍ය තැන්වල නිවැරදිව විරාම ලක්ෂණ යොදන්න.

1. ඖෂධ දෙවර්ගය 5.4 අනුපාතයට මිශ්‍ර කරන ලෙස වෙද මහතා නියෝග කළේය.
2. මහවැලි ,කැළණි, කළු වලවේ යන නම් වලින් හඳුන්වන්නේ සමනොල සිරස මුදුනින් ඇරඹෙන සිව් මහා ගංගා ය.

(ලකුණු 2)

**4)** පහත සඳහන් කියමන් නිවැරදි නම් ( √ ) ලකුණ ද වැරදි නම් ( x ) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන් තුළ සටහන් කරන්න.

1. නූතන සිංහල වර්ණ මාලාවේ ඇති අක්ෂර ගණන හැටකි. (............)
2. දුරාතීතයේ පටන් ලෝක පුදුම හත තෝරා ගැනීමට අන්තර්ජාලය හා දුරකථන මගින් ලෝක ජනමත විමසුමක්කර ඇත.
3. කුමාරතුංග මුනිදාස වියතාණන් මෙලොවට බිහිවු කාලයේ දී සිංහල භාෂාව හා සාහිත්‍ය තුළ විශාල පසුබෑමක් තිබුණි.
4. එක් දහස් නවසිය හතළිස් අටේ පෙබරවාරි හතර වන දින ශ්‍රී ලංකාව සියළු පර සතුරු ආක්‍රමණ වලින් මිදුණු ස්වාධින රටක් බවට පත් විය.
5. අප විසින් දුරදිග නොබලා කරන , සදාචාරයට පටහැනි සමහර වාගාලාපයන් සමාජයේ ගැටුම් නිර්මාණය කිරිමට හේතු වේ.

(ලකුණු 1 x 5 = 5)

හිස්තැන් වලට සුදුසු උක්ත පද හා ආඛ්‍යාත පද යොදන්න.

1. ආදි කොලොම්බියානු ශිෂ්ටාචාරයට අයත් මයන්වරු විමෙන් ඉට්සා පුජනීය නගරය නිර්මාණය ......................................................
2. .................................................. පොඩිනා සමඟ ගං ඉවුරට ගියාය.
3. .................................................. ගිරවකු සේ වචන හසුරුවයි.
4. කියවීමෙන් ළමුන්ට ජීවිතාවබෝධය ලබා ගත හැකි බව වියතණෝ .............................................
5. මම සෙමෙන් සෙමෙන් අම්මා සමඟ පතල් පොළට .........................................

(ලකුණු 2 x 20 = 40)

5) මෙහි සඳහන් ලෝකයේ පුදුම හත පිහිටි රටවල් ඉදිරියෙන් ලියන්න.

i. ක්‍රිස්තුන් වහන්සේ ගේ ප්‍රතිමාව - ..................................................................
ii. ටජ් මහල් මන්දිරය - ..................................................................
iii. පෙට්‍රා නගරය - ..................................................................
iv. කොලෝසියම - ..................................................................
v. චිචෙන් ඉට්සා පුජනීය නගරය - ..................................................................
vi. මාචු පීචු බලකොටුව - ..................................................................
vii. චීන මහා ප්‍රාකාරය - ..................................................................

(ලකුණු 7)

*** ඔබගේ පෙළපොතෙයි එන ් පාඩම ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

" මේ බලනවා තමුසෙගෙ කල්පනාවේ හැටියට මට වයස කීයක් ඇද්ද? "

i. මෙසේ පැවසුවේ කව්ද?
ii. කාහට ද ?
iii. ඔහු විසින් දුන් පිළිතුර කුමක්ද? (ලකුණු 3)

6) පහත සඳහන් පදවලින් හැඟවෙන විවිධ අර්ථ දෙක බැගින් ලියන්න.(පිළිතුරු තෝරා ගන්න)

i. සඳ - .............................. ..............................
ii. දද - .............................. ..............................
iii. නා - .............................. ..............................

(ලකුණු 3)

*** මේවාට සමාන අරුත ඇති තනි පදය තෝරා ඉදිරියෙන් ලියන්න .**

i. අනුව යාම - ....................................
ii. බලාපොරොත්තු නොවූ - ....................................
iii. අවස්ථාවට ගැලපෙන - ....................................
iv. උපතින්ම උරුම වූ - ....................................

( නිසග , සංකීර්න , අවස්තාවෝචිත , අතිශය , අනාපේෂිත , අනුකරණය )

* **මේවාට සමාන අරුත ඇති තනි පදය තෝරා ඉදිරියෙන් ලියන්න .**

i. අනුව යාම - ....................................

ii. බලාපොරොත්තු නොවූ - ...................................

iii. අවස්ථාවට ගැලපෙන - ..................................

iv. උපතින්ම උරුම වූ - ..................................

(ලකුණු 3)

* **මෙම පදවලට විරුද්ධාර්ථ දෙන පද ලියන්න .**

i. අනාත්ම - ....................................

ii. සරල - ...................................

iii. අනායාසයෙන් - ..................................

iv. දුරාචාරය - ..................................

(ලකුණු 3)